මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව - 2024

----

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **අභිතකර මතය**

මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, 2024 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **අභිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන ස්විප් බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.3,145,307ක පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.38,667,344 ක ස්ථාවර තැන්පත් පොලී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.	එම	ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් විෂයයන් 02 ක බිල්කල ආදායම රු.23,750,784 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	ජර්නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	එම
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධිත පුද්ගලයින් සඳහා පෝෂණ මල්ලක් ලබාදීමේ වැඩසටහන යටතේ ගෙවිය යුතු රු.460,000 ක මුදල ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබියදී එම කරුණටම අදාලව රු.437,500 ක් නැවතත් ණයහිමි කර තිබුණි. ඒ හේතුවෙන් එම ප්‍රමාණයෙන් ණයහිමියන් වැඩියෙන් දක්වා තිබුණි.	වැඩියෙන් ගිණුම්ගත කර ඇති ණයහිමියන් කපා හැරීමට කටයුතු කරන බව.	ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	ඉකුත් වර්ෂය තුළ ගිවිසුම් ගත වී ණයහිමි කර තිබූ එකතුව රු.32,475,000 ක ව්‍යාපෘති 30 ක් ඉදිකිරීම් නොකර අතහැර දමා තිබියදී තවදුරටත් ණයහිමියන් යටතේ දක්වා තිබුණි.	අදාළ ව්‍යාපෘති 30 පිළිබඳ සොයා බලා නිවැරදි කරන බව.	ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඊ)	ඉකුත් වර්ෂයේ දී වියදම් ලෙස ගිණුම්ගත කර, සමාලෝචිත වර්ෂයේ දී නිරවුල් කර තිබුණු එකතුව රු.1,774,997 ක විවිධ වියදම් විෂයයන් 50 ක් දෝෂ සහගතව සමාලෝචිත වර්ෂයේ දී ද ණයහිමියන් යටතේ දක්වා තිබුණි.	අදාළ ව්‍යාපෘති 50 පිළිබඳ සොයා බලා නිවැරදි කරන බව.	ණය හිමියන් සම්බන්ධයෙන් නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.290,810 ක ලී බඩු හා උපකරණ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණු අතර, තවත් ලීබඩු උපකරණ 09 ක වටිනාකම හඳුනාගෙන නොතිබුණි.	ලීබඩු හා උපකරණ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	ගබඩා ලෙජරයට අනුව 2021 වර්ෂයේ දී රු.107,700 කට මිලදී ගෙන තිබුණු විදුලි උපකරණ ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කර ගන්නා බව.	තොග නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.558,968,801ක ස්ථාවර තැන්පත් රු.508,968,801 ක් ලෙස රු.50,000,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කර ගන්නා බව.	ස්ථාවර තැන්පත් වටිනාකම නිවැරදිව ගිණුම් ගතකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් ඊට අදාළ උපලේඛන හා ලේඛන සමඟ සැසඳීමේ දී, රු.354,484 ක නොසැසඳීමක් විය.	නොසැසඳීම පිළිබඳව සොයා බලා අදාල ගැලපීම් නිවැරදි කිරීමට කටයුතු සිදු කරන බව.	ගිණුම් ශේෂ අදාල උපලේඛන සමඟ සසඳා ඉදිරිපත් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ආදායම් ගිණුම අනුව රු.16,745,324 ක ලැබිය යුතු ශේෂයක් පැවතිය ද, පරිගණක පද්ධති මෘදුකාංගය අනුව ලැබිය යුතු වරිපනම් ශේෂය රු.16,056,539ක් වූයෙන් රු.688,785 ක වෙනසක් විය.	වෙනස සඳහා හේතු වූ කරුණු සොයාබලා වාර්තා කරන බව.	වෙනස සොයා බලා ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඇ)	ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.8,500,000 ක් වටිනා පෝටෝන් මෝටර් ලොරිය මූල්‍ය ප්‍රකාශනවල රු.6,009,602 ක් ලෙස දක්වා තිබීමෙන් රු.2,490,398 ක නොසැසඳීමක් විය.	නොසැසඳීම ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව.	වෙනස පරීක්ෂා කර බලා ගිණුම් නිවැරදි කළ යුතුය.

(ඇ)	ස්ථාවර වත්කම් ලේඛනයේ වත්කම් 04ක ශේෂය රු.24,065,411 ක් වුවද ගිණුමේ ඊට අදාළ උපලේඛනයේ එය රු.18,299,921 ක් ලෙස සටහන් කිරීමෙන් රු.5,765,490 ක නොසැසඳීමක් විය.	නොසැසඳීම් පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වෙනස පරීක්ෂා කර බලා ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරි ආයෝජන ගිණුමේ ශේෂය රු.12,883,577 ක් වුවත්, නාගරික සංවර්ධන අධිකාරි තැන්පතු ගිණුමේ ශේෂය රු.18,276,558 ක් ලෙස දක්වා තිබීමෙන් රු.5,392,981 ක වෙනසක් විය.	මෙම වෙනස වසර ගණනාවක සිට පැවත එන බැවින් සොයා බලා වාර්තා කිරීමට කටයුතු කරන බව.	-එම-
(ඊ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මුදල් පොත අනුව බැංකු ශේෂය රු.175,358,208 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.190,028,118 ක් ලෙස දක්වා තිබීමෙන් රු.14,669,910ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	ජර්නල් සටහන් මඟින් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	වෙනස සොයා බලා ගිණුම් නිවැරදි කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.8,865,860 ක වත්කම් විෂයයන් 03 කට අදාළ ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	අදාල ශේෂයන් පිළිබඳව ක්‍රියාමාර්ග ගන්නා බව.	ගිණුම් විෂයයන් තහවුරු කිරීමට අදාල ලේඛන, ලිපිගොනු පවත්වාගත යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**			
	128 වගන්තිය	ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් 17 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේ දී අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව	සභාව සතු ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති**			
	218 වගන්තිය	සභාව විසින් 2019 වර්ෂයෙන් පසුව වත්කම් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.	සමීක්ෂණ සිදු කිරීමට කටයුතු කරන බව.	වාර්ෂිකව වත්කම් සමීක්ෂණ සිදු කළ යුතුය.
(ඇ)	**2020 සැප්තැම්බර් 28 දිනැති අංක 2020/06 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය.**	සභාවේ අතිරික්ත මුදල් සභාවට ආදායම් උත්පාදන සිදුකළ හැකි ආකාරයේ ව්‍යාපෘතිවල, සභා දේපල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති හෝ බහුතර ජනතාවට පොදු පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිවල ආයෝජනය කර සභා බල ප්‍රදේශයේ මහජනතාවට සේවයක් කිරීමට හා සභාවේ ආදායම් ඉහළ නංවාලීමට කටයුතු කළහැකි වුවත් එසේ කිරීමකින් තොරව රු.558,968,801 ක අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.	හඳුනාගත් අත්‍යාවශ්‍ය ව්‍යාපෘති 250 ක් පමණ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාගෙන ඇති බවත්, ව්‍යාපෘති ස්ථාවර තැම්පතු මගින් සිදු කිරීමට බලාපොරොත්තු වන බව.	අතිරික්ත මුදල් බල ප්‍රදේශයේ සංවර්ධනයට යොදාගෙන වඩාත් ගුණාත්මක සේවාවක් සැපයිය යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.174,229,357 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.133,729,043 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස් කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස් කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.
(i)	වරිපනම් හා බදු	30,996,226	29,520,892	28,832,304	16,760,607	27,205,760	27,565,562	29,246,636	16,072,019
(ii)	කුලී	16,985,932	14,141,298	14,141,298	176,082	2,022,332	3,676,872	3,500,790	176,082
(iii)	බලපත්‍ර ගාස්තු	8,512,000	15,605,103	15,631,704	386,635	3,048,050	10,188,189	9,833,202	413,236
(iv)	වෙනත් ආදායම්	168,700,000	172,287,211	225,097,434	158,189,234	159,077,400	168,643,362	99,425,240	210,999,458
	එකතුව	225,194,158	231,554,504	283,702,740	175,512,558	191,353,542	210,073,985	142,005,868	227,660,795

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම් හා බදු		
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.16,760,607 ක වරිපනම් හිඟ ශේෂයක් විය. ඉන් ඒකකයක හිඟය රු.50,000 ඉක්ම වූ ඒකක 03 ක රු.319,923 ක්ද, රු.25,000-රු.50,000 අතර ඒකක 09 ක රු.277,725 ක්ද, රු.10,000-25,000 අතර ඒකක 198 ක රු.2,769,762 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර අයකර නොතිබුණි.	හිඟ අයකිරීම සඳහා මේ වන විට අදාල දේපල හිමියන් වෙත ලිපි නිකුත් කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.

(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.625,000 ක් හා මුද්දර ගාස්තු රු.148,093,459 ක් විය.	අදහස් දක්වා නොමැත.	හිඟ ආදායම් ලබා ගත යුතුය.

2.3 අධිභාර

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂය තුළ දී රු.262,608 ක අධිභාරයක් පනවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.175,068 ක් තවදුරටත් අය කර නොතිබුණි .	පාර්ශවකරුවන් 04 දෙනෙකු අධිභාර මුදල් ගෙවා ඇති බවත්, අනෙකුත් පාර්ශවකරුවන්ගෙන් මුදල් ගෙවන ලෙස ලිඛිතව දන්වා ඇති බව.	අධිභාර අයකර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්තිවලට අනුව, මළ ප්‍රවාහනය සහ කසළ ශෝධනය සඳහා ගලි රථ සේවාවක් හා මළ පිරිපහදු ඒකකයක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.	මල ප්‍රවාහනය සඳහා ගලි රථයක් සපයා ගැනීමට හා මල පිරිපහදු ඒකකයක් ආරම්භ කිරීමට තරම් සභාව සතු සුදුසු ඉඩමක් නොමැති බවත්, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය හා කම්කරුවන් අවශ්‍ය වන අතර මහා පරිමාණයෙන් ඉටුකළ යුතු ව්‍යාපෘතියක් වන බැවින් එය ඉටුකර ගැනීමට හැකියාවක් නොතිබුණු බව.	බල ප්‍රදේශයේ ජනතාවගේ සේවාවන් වෙනුවෙන් පනතේ නියම කර ඇති කාර්යයන් ඉටුකළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.24,920,715 ක් විය. ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.19,073,822 ක් හා වසර 05 ට වැඩි කාලයක් පවතින එකතුව රු.1,135,156 ක් අයකර නොතිබුණි.	අයකර ගැනීමට ඇති ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරන බව.	ලැබිය යුතු ශේෂ අයකළ යුතුය.
(ආ)	සභාව සතු මංමාවත් 145 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2)වගන්තියට අනුව 1996 ජූලි 05 දිනැති අංක 931 දරන ගැසට් පත්‍රයේ පළ කර තිබුණද එම මංමාවත් සම්බන්ධව විරෝධතා සලකා බලා නැවත ගැසට් පත්‍රයේ පල කිරීමක් සිදුකර නොතිබුණි.	මාර්ග ඉදිරියේදී ගැසට් කිරීමට කටයුතු කරන බව.	මාර්ග ගැසට් කිරීමට කටයුතු කළ යුතුය.

3.3 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එකතුව රු.7,887,162 ක කම්පැක්ටර් ටේර්ලරයක්, ජල උපකරණ තොගයක් හා වටිනාකම තක්සේරු නොකරන ලද ටේර්ලරයක් වසර 07 ක කාලයක සිට නිෂ්කාර්යයව හෝ ඌන උපයෝජිතව පැවතුණි.	අයිතිය පවරා ගෙන වෙන්දේසි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව.	අළුත්වැඩියා කර උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාවට අයත් ගුරුදෙණිය පුර නැඟුම ගොඩනැඟිල්ලේ දෙවන මහලේ වර්ග අඩි 526 ක් සමාලෝචිත වර්ෂයේ ජුනි 30 දින සිට දෙසැම්බර් 31 දක්වා භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි.	තක්සේරු වාර්තාවක් ලබාදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට ඉල්ලීම් කිරීමට කටයුතු කරන බව.	වත්කම් උපයෝජනය කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2019 වර්ෂයේ අනුබෙදුම් කර විකුණු ඉඩම් වලින් පොදු කටයුතු සඳහා සභාව වෙත ලබාදී තිබුණු ඉඩම් කොටස් 06ක සින්නක්කර ඔප්පු ලබාගෙන නොතිබුණි.	අදාළ ඔප්පු ලබාගැනීමට කටයුතු කරන බව.	ඔප්පු ලබාගෙන වත්කම්වල අයිතිය තහවුරු කර ගත යුතුය.

(ආ) සභාව පරිහරණය කරන ඉඩම් කොටස් 04 ක අයිතිය පවරා ගෙන නොතිබුණි.	අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	වත්කම්වල අයිතිය පවරා ගත යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් 28 කගෙන් එකතුව රු.1,330,712 ක සේවක ණය අය කර නොතිබුණි.	හිඟ සේවක ණය අයකර ඉදිරියේ දී වාර්තා කරන බව.	සේවක ණය ශේෂ අයකළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

තිරසර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව, සමාලෝචිත වර්ෂයට අදාලව තිරසර සංවර්ධන ව්‍යාපෘති 10 ක් සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් වර්ෂය තුළදී ඉන් ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉදිරි වර්ෂය තුළ තිරසර සංවර්ධන ව්‍යාපෘති සිදු කරන බව.	තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගත යුතුය.